# නීල ආර්ථිකය හා ශ්‍රී ලංකාව පිළිබඳ භූ-ආර්ථිකමය විශ්ලේෂණය

ආර්. හේරත් - භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය

වර්තමාන 21 වන සියවසේ රාජ්‍ය රැසක් තම අභිලාෂ තෘප්ත කර ගැනීමේ තරගයක නිරත වෙයි. ඒ අතරින් ආර්ථික අභිලාෂ ප්‍රධාන තැනක් දරයි. එවැනි පසුබිමක වර්තමාන ආර්ථික ක්ෂේත්‍රයේ වැඩිම ආදායමක් ලැබෙන ක්ෂේත්‍රයක් ලෙස සාගරය සම්බන්ධ කර ගත් ආර්ථිකය දැක්විය හැකිය. එය වර්තමානයේ සාගර සම්පත් තිරසර ලෙස භාවිත කිරීම යන මැයෙන් *නීල ආර්ථිකය* ලෙස හඳුන්වයි. වර්තමාන ගෝලීයකරණ ලෝකය තුළ කැපී පෙනෙන ආර්ථික හා භූගෝලීය සංධිස්ථානයක පිහිටා තිබෙන ශ්‍රී ලංකාව *භූ මූලෝපායික* හා *භූ-ආර්ථිකමය* කේන්ද්‍රස්ථානයක්ද උසුලනු ලබයි. මෙකී සාධනීය ප්‍රවේශය තුළ ශ්‍රී ලංකාවේ *නීල ආර්ථික* සංකල්පය විශ්ලේෂණය කිරීම කාලෝචිතය. එමෙන්ම *නීල ආර්ථික* සංකල්පය හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ *භූ-ආර්ථිකමය* වැදගත්කම අධ්‍යයනය, නීල ආර්ථිකය සමබන්ධ ලංකාවේ වර්තමාන ක්‍රියාකාරිත්වය හඳුනා ගැනීම මෙන්ම ඒ මගින් ලංකාවට පවතින අවස්ථා හඳුනා ගැනීමත්, *නීල ආර්ථිකය* ලංකාව තුළ වර්ධනය කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය වපසරිය අධ්‍යයනයට ලක් කිරීමත් වැදගත්ය. උක්ත පර්යේෂණ ගැටලු සාධනය කර ගැනීමේ දී ඒ සඳහා දත්ත රැස් කිරීමට ද්විතීයික දත්ත හා ප්‍රමාණාත්මක දත්ත භාවිත කෙරෙන අතර ඒ මගින් පර්යේෂණයට අවශ්‍ය වන සංඛ්‍යාත්මක හා ප්‍රජා විද්‍යාත්මක දත්ත රැස් කර ගත හැකි වේ. තවද පර්යේෂණයේ විශ්ලේෂණාත්මක කාර්ය සඳහා SWOT විශ්ලේෂණ විධික්‍රමය භාවිත කරමින් පර්යේෂණයේ නිගමනයට පිටිවහල් වන ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනා ගනු ලබයි. *භූ-ආර්ථිකමය* වශයෙන් කේන්ද්‍රස්ථානයක පිහිටි ශ්‍රී ලංකාව පිළිබඳව *නීල ආර්ථිකමය* විශ්ලේෂණයට අදාළ වන දත්ත විමර්ශනය කරන විට එයින් ජනිත වන්නේ ශ්‍රී ලංකාව *භූ-ආර්ථිකමය* කේන්ද්‍රස්ථානයක පිහිටා තිබීම හේතුවෙන් ශ්‍රී ලංකාවට සාධනීය හා නිශේධනීය බලපෑම් රැසක් එල්ල වන බවයි. නමුත් එකී ද්විතික බලපෑම් අතරින් සාධනීය බලපෑමක් ලෙස *නීල ආර්ථිකය* හඳුනා ගත් විට එය ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මෙන්ම දේශීය වශයෙන්ද අවස්ථා නිර්මාණය කරන්නක් බව පෙනී යයි. කෙසේ නමුත් මෙම පර්යේෂණයෙන් උකහා ගනු ලබන දත්ත මගින් පෙනී යන ලද ප්‍රධාන කරුණ වන්නේ ශ්‍රී ලංකාවේ *නීල ආර්ථික* ක්ෂේත්‍රය තුළ ප්‍රබල ගැටලු පවතින බවයි. ඒ අතරින් සාගර සම්පත් තිරසාර අන්දමින් භාවිත නොකිරීම ප්‍රධාන තැනක් උසුලයි. මෙකී පසුබිම තුළ ශ්‍රී ලංකාව *නීල ආර්ථික* ක්ෂේත්‍රය වර්ධනය කර ගනිමින් භූ-ආර්ථිකමය වටිනාකමද ප්‍රයෝජනයට ගත යුතු ය. ඒ සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සම්පාදන ක්ෂේත්‍ර ලෙස පාලන අංශය, විද්‍යාත්මක අංශය හා ආර්ථික අංශය හඳුනාගත හැකිය. නිවැරදි අන්දමින් ශ්‍රී ලංකාව මෙකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළහොත් ජාත්‍යන්තර වශයෙන් ලංකාවට තම භූමිකාවද සාපේක්ෂ ලෙස වර්ධනය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

**ප්‍රමුඛ පද:** *නීල ආර්ථිකය, භූ-ආර්ථිකය, භූ-දේශපාලනය, භූ මූලෝපායික පිහිටීම*